# Summaries in Sinhala

## සංකීර්ණ හදිසි තත්වයන් හිදී මනෝ සාමාජීය සහ මානසික සෞඛ්‍ය වැඩසටහන් වලට උපකාරී කිරීමට සංඛ්‍යාත්මක සහ ගුණාත්මක පර්යේශණ ක්‍රමවේදයන් සංකලණය කිරීම: විශේෂ ගැටලුව හඳුන්වාදීම

මානසික සෞඛ්‍ය සහ මනෝ සාමාජීය යහපැවැත්ම යන ක්ෂෙත්‍රයන් තුළ ව්‍යවහාරික පර්යේශණ සඳහා මෙවර කලාපය විශේෂයෙන් වෙන් කර ඇත. ව්‍යසන සහ සංකීර්ණ හදිසි තත්වයන් පිළිබඳව මෙවර කලාපය අවධාරණය කරනුයේ මෙවැනි තත්වයන් තුළ පර්යේශණ හෝ මැදිහත්වීම් ක්ෂෙත්‍රය තුළ ක්‍රියාත්මක කිරීම ඉතා අභියෝගාත්මක බැවිනි. මෙම විශේෂ කලාපයේ මූලික අරමුණ වන්නේ, වැඩසටහන් සැලසුම් කිරීම, දියත් කිරීම, අධීක්ෂණය සහ ඇගයීම යන ක්‍රියාවලියට ව්‍යවහාරික පර්යේෂණයන් දයක වන්නේ කෙසේද යන්න පෙන්වා දීම ය. සේවා ලබාදෙනන්නට වැඩසටහන් වැඩිදියුණු කිරීම සඳහා සේවා සැපයීමේ දී පර්යේෂණයන් නිරතුරුවම යොදගැනීමේ හැකියාව සහ ප්‍රයෝජනය පෙන්වා දීමට අප අදහස් කරන්නෙ මු.

---

## ශ්‍රී ලාංකීය තරුණයන්ගේ දෛනික ජීවිත ආතතීන්: යුධ සහ ස්වාභාවික ව්‍යසන සංදර්භයක් තුළ තක්සේරු කිරීම සඳහා මිශ්‍ර ක්‍රමවේද ප්‍රවේශයක්

ශ්‍රී ලාංකීය ළමයින්ගේ දෛනික ආතති මාපකයක් (කී) සැකසීමට මිශ්‍ර ක්‍රමයන් යොදගත් අයුරු සහ දෛනික ආතතීන් තක්සේරු කිරීමට එය සාපේක්ෂව කරන්නාවූ දයකත්වයද, යුද්ධය සහ ස්වාභාවික විපත් වලට අනාවරණය වීම නිසා ඇතිවන්නාවූ තරුණ මානසික සෞඛ්‍ය සහ මනෝ සාමාජීය යහපැවැත්ම ද විස්තර කර යි. දෛනික ආතතීන් නොසලකා හැරීම ගැන සාකච්ඡා කර යි. අවි ගැටුම් සහ ස්වාභාවික ව්‍යසන තත්වයන් ගෙන් බලපෑම්ට පත් තරුණයින්ගේ මානසික සෞඛ්‍ය සහ මනෝසාමාජීය අවශ්‍යතාවයන් අවබෝධකර ගැනීමට සහ ආමන්ත්‍රණය කිරීමට අවි ගැටුම් සහ ස්වාභාවික ව්‍යසන තත්වයන් තුළ දෛනික ජීවිතයේ සමාජීය සහ භෞතික ආතතිමය තත්වයන් සහ  දෛනික ආතතීන් තක්සේරු කිරීමේ වැදගත්කම තහවුරු කිරීමත් පෙන්වා දෙයි. ලිපියේ මූලික අවධානය යොමු කරනුයේ, මිශ්‍රක්‍රම ප්‍රවේශයේ සංවර්ධනය මැන බැලීම යන සංදර්භය තුළ ඇති සුවිශේෂී වටිනාකම පැහැදිලි කිරීම යි.

**මුඛ්‍ය වචන:** යුද්ධය, ව්‍යසනය, දෛනික ආතතීන්, මිශ්‍ර ක්‍රමයන්, ශ්‍රී ලංකාව

---

## විඳවීම, යහ-පැවැත්ම සහ යුද්ධය: ශ්‍රී ලංකාවේ උතුරු-නැගෙනහිර සිවිල් වැසියන්ගේ සම්මුඛ සාකච්ඡාවන් ගුණාත්මකව විශ්ලේෂණය කිරීම.

මෑත කලීනව ඇතිවූ සිවිල් යුද්ධය හේතුවෙන් අවතැන්වූවන් ගේ යුධ ගැටළු (මනෝවිද්‍යාත්මක සහ චර්යාත්මක ගැටලු) සහ යහපැවැත්ම සංස්කෘතිකව සංවේදී ලෙසින් මැණ බැලීමේ ක්‍රමෝපායන සැකිල්ලක් අප ඉදිරිපත් කරන්නෙ මු. සිවිල් යුද්ධයෙන් බලපෑමට ලක්වූ ප්‍රදේශ වල ජීවත්වන පුද්ගලයන් සමඟ කරන ලද ගුණාත්මක දත්ත රැස්කිරිම තුළින් මෙම මිණුම් ලබාගන්නා ලදී. අප විවෘත කේතකිරීම සහ තේමා අනුව විශ්ලේශණය යන ක්‍රම දෙකම යොද ගනිමින් ගුණාත්මක දත්ත විශ්ලේෂණය කරන ලදී. නිරන්තරයෙන් කේත කෙරුනු සටහන් වල නිදසුන්ද, ඔවුන් විසින් සකසනු ලැබූ ප්‍රශ්නාවලීන්ද ඉදිරපත් කර ඉදිරි පියවරයන් (මිණුම්හි වලංගුතාවය) ගැන සාකච්ඡා කරන ලදී.

**මුඛ්‍ය වචන:** සංස්කෘතික , ප්‍රශ්නාවලීන්, ගුණාත්මක දත්ත විශ්ලේශනය, ශ්‍රී ලංකාව



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.

*Intervention 2009, Volume 7, Number 3, Page 289 - 291*

## කකුමා චිත්තවේගී යහපැවැත්ම පිළිබඳ සම්මුඛ සාකච්ඡාව ගැන ඇගයීමක්

මනෝ සාමාජීය ගැටලු සඳහා කරන්නාවූ මැදිහත්වීම් වල සාර්ථකත්වය රඳා පවතින්නේ සහයෝගය අවශ්‍ය කලාපයන් නිවැරදිව හඳුනාගැනීමෙන් සහ මැදිහත්වීම ඇත්තෙන්ම උපකාරී වීද යන්න මැන බැලීමෙනි. මෙම අධ්‍යයනය තුළින් ගුණාත්මක සහ සංඛ්‍යාත්මක ක්‍රමයන් යොදගනිමින් දේශිය වශයෙන් අර්ථයන් සහිත චිත්තවේගී යහපැවැත්ම (කකුමා චිත්තවේගී යහපැවැත්ම සම්මුඛ සාකච්ඡාව [KEWI]) තක්සේරු කිරීමට ගත් උත්සහයක් ඇගයීමට ලක් කර යි. සංඛ්‍යාත්මක අධ්‍යනයට අනුව විශ්වසනීයත්වයක් සහ වලංගුතාවයක් KEWI ට ලැබී ඇති බව පෙන්නුම් කළද ගුණාත්මක තත්වයන් අභියෝගයන් කිහිපයක් මතුකර දක්ව යි.

මෙම පර්යේශණයේ සොයාගැනීම් මනෝ සාමාජීය යහපැවැත්ම තක්සේරු කිරීමේදී එම ජන සමූහයට අදල වන ජීවන අංගයන් මත පදනම් කිරීම සහ ඔවුන් ජීවත්වන තත්වයන් ගණනය කිරීමේ ක්‍රමයන් සොයාගැනීම වැදගත් බව පැහැදිලි කර යි. තක්සේරු මෙවලමක් සැලසුම් කිරීමට, සැකසීමට මෙන්ම තක්සේරු තොරතුරු යොදගන්නේ කෙසේද, ප්‍රයෝජනවත් සහ නිවැරදි තොරතුරු ලබා ගන්නා ආකරයන් පිළිබඳව තීරණ ගැනීමේදීද සත්‍ය වශයෙන්ම ප්‍රජාව සහභාගීකර ගැනීමේ අවශ්‍යතාවයක් ඇත. තවද, මෙවලම සැකසීමට සහ ප්‍රතිපල අර්ථකතනය කිරීමට ද ඒ සඳහා යොද ගන්නා ජනගහනයේ වටිනාකම් සහ අපේක්ෂාවන් පිළිබඳ හොඳ අවබෝධයක් තබිය යුතු ය.

**මුඛ්‍ය වචනඃ** තක්සේරු කිරීම, යහපැවැත්ම, මිශ්‍ර ක්‍රමයන්, සරණාගතයින්, කෙන්යාව

## පශ්චාත් ගැටුම් තත්වයන් තුළ අසරණභාවයට පත්වුන සමාජ කණ්ඩායම්ඃ මිශ්‍ර ක්‍රම ප්‍රතිපත්ති විශ්ලේණයක් සහ නේපාලයේ කුලය සහ මනෝ සාමාජීය රෝගීබව පිළිබඳ වසංගත අධ්‍යයනය.

පශ්චාත්-ගැටුම් තත්වයන් තුළ මනෝ සාමාජීය මැදිහත්වීම් වැඩසටහන් සැකසීමට සහ දියත්කිරීමට සංදර්භය, තත්වය, අසරණභාවයට පත් සමාජ කණ්ඩායම්වල අවශ්‍යතාවයන්, පිළිබඳව පුළුල් දැණුමක් අවශ්‍ය වේ. ඓතිහාසික ප්‍රතිපත්ති කතිකා විශ්ලේෂණය යොදගනිමින් නේපාලයේ අසරණභාවයට සම්බන්ධ වර්තමාන සමාජ කොටස් - විශේෂයෙන් කුලය -  හි ප්‍රභවය සෙවීමට මෙම අධ්‍යයනය උත්සහ දර යි. ප්‍රතිපත්ත විශ්ලේශණය විසින් වැඩිහිටියන් 316 නියැදියකින් වසංගත අධ්‍යනය දත්ත තිරස්-කඩක් අර්ථ දැක්වීමට යොද ගෙන ඇත. විශ්ලේශණය තුළින් කුලය සහ මනෝවිද්‍යාත්මක රෝගීබව, අනාගත මැදිහත්කරුවන් ද සහිතව සාමාන්‍ය සෞඛ්‍ය ප්‍රශ්නාවලියක් (GHQ-12) යොදගනිමින් පරීක්ෂා කර යි.

අනෙක් කුල සහ වාර්ගික කන්ඩායම් හා බලන කළ පහත් කුල වඩා වැඩියෙන් මනෝවිද්‍යාත්මක රෝගීවන බව අනාවරණය විය. ආදයම් සහ ආතතිමය ජීවන සිදුවීම් අර්ධ වශයෙන් කුලය සහ මනෝවිද්‍යාත්මක රෝගීබවට බලපැම් කර ඇත. මෙම සොයාගැනීම් සමාජ අන්තර්-ක්‍රියාකාරීත්වයන්ට ඇති සීමාවන්, සම්පත් ලබාගැනීමට ඇති අවකාශයන්, සමාජ පාලනය සහ දඬුවම, සමාජ සංචලනතාවය සහ ස්ත්‍රී පුරුශ සම්බන්ධතායන්ද ඇතුළුව ප්‍රතිපත්ති විශ්ලේෂනයේ තේමාවන් යමින් අර්ථදක්වා ඇත.

**මුඛ්‍ය වචනඃ** ප්‍රතිපත්ති විශ්ලේෂණය, මිශ්‍ර ක්‍රමයන්, කුලය, නේපාලය


Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.

## 2005දී පකිස්ථානයේ, මන්ශේරා, හඋත්‍ෂ, භූමිකම්පාවෙන් පසු මානසික සෞඛය මැදිහත්වීමක් සැකසීමට ක්ෂේත්‍ර-මූලික තක්සේරු මිශ්‍ර ක්‍රමයක්

භූමිකම්පාවෙන් බලපෑමට පත් පකිස්ථානයේ වයඹ දේශ සීමා ප්‍රාන්තය (NWFP), ප්‍රමාණවත් මානසික සෞඛ්‍ය සේවා අතින් ගත් කළ රටතුළ ඉතා අවම වශයෙන් සේවය සපයීමට ලක්වන්නාවූ ප්‍රදේශයකි. මෙම ලිපිය භූමිකම්පාවෙන් බලපෑමට පත් NWFP ප්‍රාන්තයේ, මාන්ශෙරා දිස්ත්‍රික්කයේ මානසික සෞඛය මැදිහත්වීමක් සැකසීමට යෙදගත් ක්ෂේත්‍ර-මූලික තක්සේරු මිශ්‍ර ක්‍රමය විස්තර කර යි. මෙම තක්සේරුවේ අරමුණ වූයේ මානසික සෞඛ්‍ය ගැටලු සහ ප්‍රමුඛතාවයන් ගැන වඩාත් සම්පූර්ණ සහ විස්තරාත්මක අවබෝධයක් ලබාගැනීම තුළින් මානසික සෞඛය මැදිහත්වීම් නිර්මාණය කිරීමට සහ තේරීමට උපකාරී කිරීම ය. සංඛ්‍යාත්මක මෙන්ම ගුණාත්මක දත්ත රැස්කරන ලදී. වෙන් වෙන් වශයෙන් විශ්ලේෂණය කරන ලද මෙම දත්ත, අවසාන තක්සේරුවේදී ඒකාබද්ධ කරන ලදී.

භූමිකම්පාවෙන් බලපෑමට ලත් ජනගහනයේ මානසික සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය සහ ප්‍රජා ස්වේච්ඡාදායකයින්ට මානසික සෞඛ්‍ය පුහුණුවක් ලබා දීම ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු මැදිහත්වීමක් ලෙස ප්‍රතිපලයන් අනාවරණය කෙරුනි. මෙම තක්සේරුව මැදිහත්වීම් පුහුණුකිරීම සඳහා මාතෘකා තේරීමට උපකාරී විය.

**මුඛ්‍ය වචන:** ගුණාත්මක දත්ත, සංඛ්‍යාත්මක දත්ත, පකිස්ථානය, මානසික සෞඛ්‍ය, භූමිකම්පාව



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.